# පිල්ලේගේ පිල්ලි

*නොව පැරණිය වන රමණිය විටින් විට*
*සැළලිහිණිය වදු කැළණිය පුරවරට*

මාතෘකාවට සුදුසු උධෘතයක් නොවේ. එහෙම කියන්නේ රාහුල හිමියන් මෙහෙම දේකට ගාවා ගැනීම හරි නැති හින්දා ය. මා මුහුණ පා සිටින අසීරුව දුටු කල්හි උන්වහන්සේ අමනාප නොවී මා දෙස කාරුණික බැල්මක් හෙළනු ද ඇත.

බුදුන් සමග පවා හරි අල්ලපු මාරයාට දෙවි කෙනකුට තරවටු කිරීම මොන කජ්ජක්ද?



කැළණියේ වීරයා කළේ තරවටුවක් නොවේ. ලෝක ප්‍රකට සාම දූතිකාවකට මගුලක් කතා කිරීමය.

මගුල් කතා කිරීම මේ පක්ෂයේ අයට පුරුද්දක් වාගේය. මට එකපාරටම සිහිපත්වනුයේ මේ නොබෝදා ඔය පක්ෂයේම මෙල්බර්න් "කකුලක්" (සමාවන්න. මට ඊට වඩා හොඳ වචනයක් හොයා ගත නොහැකි විය) තමාගේ දුවකටත් වඩා බාල ගැහැනියකට කළ යෝජනාව ය. මෙල්බර්න් හාදයා එක අතකින් කැළණි පුරුෂයාට වඩා සූත්තරකාරයෙකි. ඔහු කළේ හෙම්හිටය. අසරණ කාන්තාව නොසිතූ මොහොතක හස්තස්පර්ශයක්ද පිරිනමමිනි. යෝජනා ව, ඒ දිනවල බිරිඳ ගෙදර නැති බැවින් ඔහු සමග එක්වන්නට නිවසට එන ලෙසය.




තිස්වසරක ත්‍රස්ත ව්‍යසනයකින් පසු උදා කරගත් සාමය පිළිබඳ සිවුවැනි සංවත්සරය උත්සවාකාරයෙන් සමරා හති අරිමින් හිටි ශ්‍රී ලංකාවට කියලාවත් කරගන්න බැරි දෙයක් ලෙසින් ගත යුතු සම්ප්‍රාප්තියක් කේ ඩී ඩේවිඩ්ලා සහ මනප්පුලා විසින් අන්ත නිහීන විකට ජවනිකාවක් බවට පත් කිරීම ජාතික අපරාධයක් නොවේද?

රජ්ජුරුවන් හන්තාන කඳුවැටිය දෙස නෙත් යොමා ගෙන සිටිති. ඇමතියන් අමතා කන්ද පෙන්වන ඔහු බලා සිටින්නේ ඇමති පිළිතුරුය.

"දේවයන් වහන්සේගේ අනුහස් දැකලා කන්ද වෙවුලනවා.."

අන්දරේගේ කට පොපියනවාය. ඔහු බලා ඉන්නේ ලොක්කා තමාගේ අදහස විමසන තෙක්ය.

"අන්දරේ උඹට පේන්නේ නැද්ද ඒක..?"

"නැත්තේ මොකද? හාමුදුරුවනේ කන්ද ගිඩි ගිඩි ගාලා වෙවුලනවා. ඒ වෙවුලන්නේ බයේ නෙවෙයි.. හිනාවෙන කොට වෙවුලන වෙව්ලිල්ලක්.. අනේ මේ රටේ ඇමතිවරුන්ට මේ රජ්ජුරුවො රැවටෙන හැටි කියලා කන්දට හිනා"

නවනීතන් පිල්ලේ මැතිනියගේ ආගමනයට පෙර හා පසුවත් කැළණි වීරයා සහ තවත් මුඹරි ඇමතියන් කටමැත දෙඩුවේ කන්ද උඩ රට රජු පිනවන්නට සිතූ ඇත්තන් වාගේ නොවේද. කාට නම් කිව හැකිද?

දැන් ඉන්දියාව දක්වන ආකල්පය පවා හරි හැටි දැන ගැනීමට රජය සමත් නොවන්නේ ඉදිරිපත් කළ හැකි විදියේ ප්‍රගතියක් කිසිම ප්‍රශ්නයක් විසඳීම සම්බන්ධයෙන් ලබන්නට නොහැකි වීම නිසා ය.

"නටපු තොයිලයකුත් නැත .. බෙරේ පලුවකුත් නැත"

මෙතන නම් බෙරේ කෑලිත් නැත . 2009 ජූනි මාසයේ ත්‍රස්ත යුද්ධය හමාර කළ පසු කොයිතරම් කැවුම් කිරිබත් කන්නට ඇද්ද? හමුදා පෙළපාලි කීයක් නම් පවත්වන්නට ඇද්ද? කොච්චර සද්ද බද්ද කළාද?

සර්ව පාක්ෂික සාකච්ඡාවක් පවත්වා නැත . කතාව විතරය. දෙමළ පක්ෂ හෝ දේශපාලකයන් සමග වැදගත් අදහස් හුවමාරුවක් කර නැත . මෙබඳු ජාතික ප්‍රශ්නයක් නිරාකරණය කිරීමෙහි ලා කවර හෝ ප්‍රජාතන්ත්‍රික රජයක් අනිවාර්යයෙන්ම කරන දෙයක් වූ විපක්ෂයේ සහය ලබා ගැනීම පවා රජයේ ප්‍රමුඛතා ලැයිස්තුවට අඩංගු වී නැත .

කොටින්ම තිස් අවුරුදු අරගලයට මුල් වූ ප්‍රශ්නය දැන් යට ගිහිල්ලාය - යට ගහලාය. ප්‍රභාකරන්ගේ ඡායාරූප ඔස්සේ පමණක් නොව විප්‍රවාසී දෙමළ ජනතාව විසින්ද නගන හඬ මහා ඝෝෂාවක් හා කන්දොස්කිරියාවක් වන තෙක් අත පොරවාගෙන සිටියේ ඇයි?

නවනීතන් පිල්ලේ මැතිනිය එන බව ආරංචි වූ මොහොතේම කළ යුතුව තිබුණේ රජය හා නායකයන් වැටී සිටි මහා නිද්‍රාවෙන් අවදි වී දෑස් ඇර වටපිට බලන එකය. ආගන්තුක විශේෂඥයාට නින්දා අපහාස කිරීම නොවේ.

පවට පින් දෙන එක පහසුද නොවේ.

**අන්තර්ජාලයෙන් සන්නස**
**www.sannasa.net හෝ www.sannasa.com**







# αlpha academy

Primary, Secondary ,VCE

2014 **Program - Enrollments open**

Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts, Analytical Writing

Classes conducted by Current School Teachers

**Contact - Sarah on 0457908918**
ABN 52267352093